# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 4 දරන සමථ මණ්ඩල (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 පෙබරවාරි මස 23 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 පෙබරවාරි මස 25 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 2.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2011 අංක 4 දරන සමථ මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 පෙබරවාරි මස 23 වන දින]

එල්. ඩී.—ඕ. 25/2010

### 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2011 අංක 4 දරන සමථ මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ 7 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1988 අංක 72 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියෙහි (අ) ඡේදයෙහි "වටිනාකම රුපියල් විසිපන්දහස" යන වචන වෙනුවට "වටිනාකම රුපියල් දෙලක්ෂ පනස් දහස" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියෙහි (ඇ) ඡේදයෙහි "මේ පනතේ දෙවන උපලේඛනයෙහි සඳහන් වරදක් නම්," යන වචන වෙනුවට "මේ පනතේ දෙවන උපලේඛනයෙහි සඳහන් වරදක් නම්; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එම උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඈ) ඒ වරද, වටිනාකම රුපියල් පන්දහසක් නොඉක්මවන යම් දේපළක් සම්බන්ධයෙන්, වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 367 හෝ 368ආ වගන්තිය යටතේ සිදු කරන ලද යම් වරදක් නම්,".

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.